සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

50 S I

# දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : ........................................ **නාට්‍ය හා රංග කලාව I** කාලය : පැය 01යි.

- **සැලකිය යුතුයි:**
  1. **I කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
  2. **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

---

- **පහත දැක්වෙන ගීත ඛණ්ඩ ඇසුරෙන් 1 5 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A
හනික වරෙව් කොල්ලනේ
මෙන්න මෙහෙ වරෙව්
මෙන්න මෙහෙ වරෙව් කොල්ලනි
නට නටා වරෙව්

B
හෙළ ගැඹුරුයි
පුත නොබලන්
සෙලවෙනකොට
වැල්පාලම
දැස පියන්
බිම නොබලන්

C
ප්‍රේමයෙන් මන රංජිත වේ
නන්දිත වේ
පුෂ්පයෙන් වන සුන්දර වේ
ලංකෘත වේ

D
සෝභාව දේ මෙපුර
සිරි විසිතුරු
බලනු මිතුර
මග පියකරු වූ
සුසුදු වලා කැරලි පලසකි මේ
මග දිග ඇතිරු
අහස සූරන මැදුරු

E
මූදු පතුල යට ඉදලා
මුතු ඇටයක නිදි කරලා
පෙන කැටියක පා කරල
මගේ දෝතට පුතු ආවා

01. නූතන නාට්‍ය කලාවේ ආරම්භය සනිටුහන් කල නාට්‍යයට අයත් ගීත ඛණ්ඩය වන්නේ,
(1) A ය (2) B ය. (3) C ය. (4) D ය.

02. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ නාට්‍යයක් ඇසුරෙන් නිර්මාණය වූ නාට්‍යකට අයත් ගීත ඛණ්ඩය වන්නේ,
(1) D ය (2) A ය. (3) B ය. (4) C ය.

03. 'තාරාවෝ ඉගිලෙති' නාට්‍යයට අයත් ගීත ඛණ්ඩය වන්නේ,
(1) A ය (2) D ය. (3) B ය. (4) E ය.

04. 'යෙර්මා' නම් නාට්‍යයේ අනුවර්තනය නාට්‍යයට අයත් ගීත ඛණ්ඩය වන්නේ,
(1) D ය (2) E ය. (3) C ය. (4) B ය.

05. ග්‍රීක 'සැටර්' නාට්‍යක් ඇසුරෙන් නිර්මාණය වූ නාට්‍යයට අයත් ගීත ඛණ්ඩය වන්නේ,
(1) A ය (2) D ය. (3) C ය. (4) E ය.

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

06. රූපණ කාර්යයේදී වඩාත් අත්‍යාවශ්‍ය වන චලන වර්ගය වන්නේ,
(1) ස්වභාවික චලන (2) නිර්මිත චලන (3) නිදහස් චලන (4) තාලානුකූල චලන

07. 'නෘත්ත' යනු,
(1) පසුතලය ප්‍රභලව භාවිත කරන්නකි. (2) සාත්විකාභිනය ප්‍රබලව යොදා කරන නිරූපණයකි.
(3) හුදෙක් රිද්මයානුකූල චලනයන් පමණක් (4) වාචිකාභිනය බහුලව යොදා ගැනෙන්නකි.

08. 'නෘත්ත' වලට අදාළ නර්තනාංගයක් වන්නේ,
(1) සොකරි, කෝලම් වඩිග පටුන (2) ආවැන්දුම, මනිපුරි, වඩිගපටුන
(3) භරත, කථක්, කථකලි (4) ලී කෙළි, කළගෙඩි නැටුම, වෙස් නැටුම

09. නාට්‍යකලාවේ දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයක් වන්නේ,
(1) නරඹන්නාට පුළුල් අත්දැකීමක් ලබාදීම (2) රූපණ හැකියා වර්ධනය වීම
(3) නාට්‍ය ශිල්පීන්ගේ සුවිශේෂ හැකියා මතුකිරීම (4) අනුෂාංගික කලා සුසංයෝගය

10. දෘශ්‍ය මාධ්‍ය පමණක් දක්වෙන වරණය වන්නේ,
(1) චිත්‍රපට, ටෙලිනාට්‍ය, බැලේ (2) චිත්‍ර, මූර්ති, කැටයම්
(3) ඔපෙරා, ගීත නාට්‍ය, මුද්‍රා නාට්‍ය (4) අභිරූපණ, රූකඩ, සංගීතය

11. රංග භාණ්ඩ යනු,
(1) වේදිකාවේදී නළුනිළියන් විසින් භාවිත කරන භාණ්ඩයකි.
(2) නළු නිළියන්ගේ චරිතානුකූල රංගනයයි.
(3) නළු නිළියන් රංගනයේදී පළඳින ආභරණයි.
(4) පසුතල අලංකරණ හා නළුවා භාවිතා කරණ භාණ්ඩයි.

12. නාට්‍යෝපකරණ නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණක් නොවන්නේ,
(1) සරල වීම හා සැහැල්ලු වීම (2) නළුවන්ගේ රංගනයට බාධාවක් නොවීම
(3) පහසුවෙන් පරිහරණය කළ හැකි වීම (4) මනා අලංකරණයෙන් හා විචිත්‍රත්වයෙන් යුතු වීම

13. ''ගුරුවරයා ඔබේ දෑස් පටියකින් ආවරණය කර විවිධ වූ භාණ්ඩ කිහිපයක් හඳුනා ගැනීමට ඔබට අවස්ථාව ලබා දෙයි.'' මෙම ක්‍රියා කාරකම සම්බන්ධ වන්නේ,
(1) ඇස සම්බන්ධ සංවේදන අභ්‍යාස (2) සිරුර සම්බන්ධ සංවේදන අභ්‍යාස
(3) අත සම්බන්ධ සංවේදන අභ්‍යාස (4) මනස සම්බන්ධ සංවේදන අභ්‍යාස

14. මනස සම්බන්ධ අභ්‍යාස කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ,
(1) දුර සහ ළඟ පෙනෙන දේ වෙන්කර හඳුනාගැනීම
(2) මනස සැහැල්ලු වීම
(3) චරිතයකට ඉක්මනින් සමාරෝපය වීම
(4) පරිකල්පන ශක්තිය වර්ධනය කර ගැනීමට හැකිවීම

15. රංග ක්‍රීඩාවලින් ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ,
(1) නායකත්ව හුරු වීම (2) ක්‍රීඩාවට අවශ්‍ය ප්‍රබෝධය ලැබීම
(3) ක්ෂණිකව ක්‍රියාත්මක වීමට හුරුවීම (4) කණ්ඩායම් හැඟීම

- **පහත ඡායාරූපය ඇසුරෙන් 16 - 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර සපයන්න.**


ක


ග


ට


ජ


ඩ

16. මෙහි ''තාරාවෝ ඉගිලෙති'' නාට්‍යයේ රංගනයෙන් දායක වූ ශිල්පියා/ශිල්පිනිය දක්වෙන්නේ,
(1) 'ග' ඡායාරූපයේ ය.(2) 'ක' ඡායාරූපයේ ය. (3) 'ජ' ඡායාරූපයේ ය. (4) 'ඩ' ඡායාරූපයේ ය.

17. මෙහි ''කුවේණී'' නාට්‍යයේ රංගනයෙන් දායක වූ රංගන ශිල්පියා/ශිල්පිනිය දැක්වෙන්නේ,
(1) 'ජ' ඡායාරූපයේ ය. (2) 'ග' ඡායාරූපයේ ය. (3) 'ඩ' ඡායාරූපයේ ය. (4) 'ට' ඡායාරූපයේ ය.

18. මෙහි ඉංග්‍රීසි නාට්‍ය ක්ෂේත්‍රයේ කැපී පෙනෙන රංගන ශිල්පියා/ශිල්පිනිය දැක්වෙන්නේ
(1) 'ක' ඡායාරූපයේ ය. (2) 'ඩ' ඡායාරූපයේ ය.
(3) 'ට' ඡායාරූපයේ ය. (4) 'ජ' ඡායාරූපයේ ය.

19. මෙහි විකෘති නාට්‍යයේ රංගනයෙන් හා අධ්‍යක්ෂණයෙන් දායක වූ රංගන ශිල්පියා/ශිල්පිනිය දැක්වෙන්නේ
(1) 'ක' ඡායාරූපයේ ය. (2) 'ග' ඡායාරූපයේ ය. (3) 'ට' ඡායාරූපයේ ය. (4) 'ජ' ඡායාරූපයේ ය.

20. මෙහි 'අනේ අබ්ලික්' නාට්‍යයෙන් රංගනයට ප්‍රවිෂ්ට වූ රංගන ශිල්පියා/ශිල්පිනිය දැක්වෙන්නේ
(1) 'ග' ඡායාරූපයේ ය. (2) 'ක' ඡායාරූපයේ ය. (3) 'ට' ඡායාරූපයේ ය. (4) 'ජ' ඡායාරූපයේ ය.

● **පහත රූප සටහන ඇසුරෙන් අංක 21 - 25 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



21. මෙම නාට්‍යමය අවස්ථාව හා සම්බන්ධ ශාන්තිකර්මය වන්නේ,
(1) සන්නියකුම
(2) රිද්දි යාගය
(3) සූනියම් යාගය
(4) දෙවොල් මඩුව

22. මෙම ශාන්ති කර්මයේ පුරා වෘත්තය හා සම්බන්ධ චරිතයක් වන්නේ,
(1) අසුපාල බිසව (2) රිද්දි බිසව් (3) සූනියම් යක්ෂණිය (4) මැණික් පාල බිසව්

23. මෙම ශාන්ති කර්මය පැවැත්වීමේ අරමුණක් වන්නේ,
(1) වඳ ස්ත්‍රීන්ට දරුවන් පැතීම
(2) සශ්‍රීකත්වය හා සෞභාග්‍ය අපේක්ෂා කිරීම
(3) ගමකට රටකට සෙතක් ශාන්තියක් අපේක්ෂා කරීම
(4) පුද්ගලයෙකුට සිදු කර ඇති හූනියමක් හෝ විණ කැපීම

24. ඉහත ඡායාරූපයේ දැක්වෙන චරිතය,
(1) රජ කෙනෙකි (2) නැට්ටුවෙකි (3) බමුණෙකි (4) යක්දෙස්සෙකි

25. මෙම අවස්ථාව හඳුන්වනු ලබන්නේ,
(1) වඩිග පටුන (2) කපුයක්කාරිය (3) සන්නි 18 (4) දොළහ පෙළපාලිය

● **නිවැරදි පිළිතුර සපයන්න.**

26. දොළහ පෙළපාලියට අයත් නොවන්නේ,
(1) බුලත්විට කැම (2) කොණ්ඩා කුරු ගැසීම
(3) සළුපාලිය (4) නානුගැම

27. නාට්‍යයේ සංගීතය අදාළ වන්නේ,
(1) සාත්වික අභිනය (2) ආහාර්ය අභිනය (3) වාචික අභිනය (4) ආංගික අභිනය

28. ''වීදි' නාට්‍ය කලාවේ පියා'' ලෙස හඳුන්වන නාට්‍ය කරුවා වන්නේ,
(1) පරාක්‍රම නිරිඇල්ල (2) එච්.ඒ. පෙරේරා
(3) ගාමිණී හත්තෙට්ටුවේගම (4) හෙන්රි ජයසේන

29. ''සොඳුරු ආඥාදායකයා'' කෘතිය රචනා කරන ලද නාට්‍ය කරුවා වන්නේ,
(1) සුගතපාල ද සිල්වා (2) හෙන්රි ජයසේන (3) බන්දුල ජයවර්ධන (4) සයිමන් නවගත්තේගම

30. ඔහුගේ නාට්‍ය වන්නේ,
(1) තට්ටු ගෙවල්, බෝඩිං කාරයෝ, හරිම බඩු හයක්
(2) ජනේලය, කුවේණි, තවත් උදෑසනක්
(3) සෝෂක වස්තුව, ස්වර්ණ හංස, ස්වර්ණමාලි
(4) සුභ සහ යස, පණ්ඩුකාභය, පුස්ලොඩං

31. ''දික්තල කාලගෝල නාට්‍යයේ'' කාලගෝලයාගේ චරිතය රංගනයෙන් දායක වූ ශිල්පියෙකු නොවන්නේ,
(1) උදේනි චන්ද්‍රසිරි (2) ග්‍රැන්විල් රොඩ්රිගෝ (3) රිචඩ් මානමුදලි (4) සමන් ගුණසිංහ

32. ''ඇත්තටම මාගේ හිතත් ඒ වාගේමයි'' දික්තල කාලගෝල නාට්‍යයේ මෙම ප්‍රකාශය කරන්නේ,
(1) දික්පිටියා (2) කාලගෝල (3) දික්තලා (4) මහෞෂධ පඬිතුමා

33. සංඛපාල රජු හා සම්බන්ධ කතා පුවත සඳහන් වන්නේ,
(1) සූනියම් යාගයේය. (2) රට යකුම් යාගයේය.
(3) දෙවොල් මඩුවේය. (4) සන්නි යකුම් යාගයේ ය.

34. ශ්‍රී ලාංකික ඉතිහාසයේ මූලාරම්භයේ පවා ස්ත්‍රිය පීඩාවට ලක් කළ සිදුවීම් වූ බව පෙන්වූ නාට්‍ය වන්නේ,
(1) ස්වර්ණමාලි (2) හරිම බඩු හයක් (3) කුවේණි (4) සුදු සහ කළු

35. එම නාට්‍යයේ නිර්මාණකරුවා වන්නේ,
(1) හෙන්රි ජයසේන (2) සුගතපාල ද සිල්වා
(3) සයිමන් නවගත්තේගම (4) බන්දුල ජයවර්ධන

36. අංග රචනයේ දී මුහුණේ ප්‍රධාන කලාප වන්නේ,
(1) නළල, ඇස්, කම්මුල, නාසය, කට, නිකට (2) හිසකෙස්, නළල, ඇස්, ඇහිබැම, කට, නිකට
(3) හිස, නළල, කම්මුල, ඇස්, කට, නිකට (4) හිස, නළල, නාසය, කට, කම්මුල

37. අංග රචනයේ ප්‍රධාන අරමුණ වන්නේ,
(1) නළුවාගේ මුහුණේ ප්‍රභාමත් බව ඇතිකර ගැනීම සඳහා
(2) ප්‍රේක්ෂාව ඇති කර ගැනීම සඳහා
(3) නළුවාගේ බාහිර අඩුපාඩු මගහරවා ගැනීම සඳහා
(4) මුහුණේ පැතලි බව මගහරවා ගැනීම සඳහා

38. නිශ්චිත රටාවකට අනුව බෙදා වෙන් කළ ක්‍රමයකට කරනු ලබන චලන වන්නේ,
(1) ස්වාභාවික චලන (2) තාලානුකූල චලන (3) නිර්මිත චලන (4) ගණිතමය චලන

39. දික්තල කාලගෝල නාට්‍යමය තේමාවක් වන්නේ,
(1) විශ්වාසය ඇති කිරීම දුෂ්කරයි.
(2) කාන්තාවකගේ සිත විශ්වාස කල නොහැකියි.
(3) නොගැලපෙන පුද්ගලයන් තම ජීවිතය ලංකර නොගත යුතුයි.
(4) ජීවිතය යනු අස්ථිර සබඳතාවලින් යුක්ත වූවකි.

40. දික්තල කාලගෝල නාට්‍යයේ දැකිය හැකි නාට්‍ය ධර්ම ලක්ෂණයක් නොවන්නේ,
(1) පූර්ව රංගයක් තිබීම (2) සරල අංග රචනයක් තිබීම
(3) තාලානුකූල දෙබස් උච්චාරණය (4) මංගලම් සින්දුවෙන් නාට්‍ය අවසන් වීම

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

50 | S | II

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## Second Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : ........................................... නාට්‍ය හා රංගකලාව - ප්‍රායෝගික පරීක්ෂණය

01. නිර්දිෂ්ට නාට්‍ය පිටපත ඇසුරින් නාට්‍ය ධර්මී සංවාද ඛණ්ඩයක් ඉදිරිපත් කිරීම (ලකුණු 10)

02. නාට්‍ය ගීතයක් රංගනය සමඟ ඉදිරිපත් කිරීම (ලකුණු 10)

03. ගුරුභවතා විසින් ලබා දෙන ලද මාතෘකාවකට අනුව ක්ෂණික නිරූපණයක් ඉදිරිපත් කිරීම (ලකුණු 15)

04. ඔබ කැමති කත්න්දරයක් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම (ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

| 50 | S | II |
|---|---|---|

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

## Second Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : ........................................ නාට්‍ය හා රංගකලාව II කාලය : පැය 02යි.

- පළමුවෙනි ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. (i) දික්තල කාලගෝල නාට්‍ය සඳහා වස්තු බීජය සපයා ගත් මූලාශ්‍රය කුමක් ද? (ල. 2)
(ii) මෙම නාට්‍ය නිර්මාණය සඳහා පාදක කරගත් නාට්‍ය සම්ප්‍රදාය කුමක්ද? (ල. 2)
(iii) මෙම නාට්‍යයේ මුල් නිර්මාණකරුවාගේ වෙනත් නාට්‍ය දෙකක් ලියන්න. (ල. 2)
(iv) දික්තල කාලගෝල නාට්‍ය මුල්වරට රංගගත වූ වර්ෂය කුමක් ද? කොහේදී ද? (ල. 2)
(v) මෙහි ගැටුම් අවස්ථා මොනවා ද? (ල. 2)
(vi) මෙම නාට්‍යයේ නිර්මාණශීලීත්වය පිළිබඳ ඔබේ අදහස කෙටියෙන් ලියන්න. (ල. 2)

02. (i) රූපණය යනු කුමක් ද? නිර්වචනය කරන්න. (ල. 3)
(ii) රූපණ කාර්යයේදී නළුවෙකු අවධානය යොමු කළ යුතු කරුණු 04ක් පැහැදිලි කරන්න. (ල. 4)
(iii) නළුවෙකු රූපණ කාර්ය සාර්ථක කර ගැනීමේදී අවශ්‍ය ගුණාංග හා ඒවා වර්ධනය කර ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ල. 5)

03. (i) නාට්‍යමය අවස්ථාවක් යනු කුමක් ද? නිර්වචනය කරන්න. (ල. 3)
(ii) නාට්‍යමය අවස්ථා වල දකිය හැකි ලක්ෂණ තුනක් ලියන්න. (ල. 3)
(iii) ඔබ නැරඹූ නාට්‍යයක ගැටුම් අවස්ථාවන් දෙකක් පැහැදිලි කරමින් ඉහත කී ලක්ෂණ ඒවායෙහි අන්තර්ගත වූ ආකාරය පැහැදිලි කරන්න. (ල. 6)

04. (i) ක්ෂණික නිරූපණය යනු කුමක්ද? නිර්වචනය කරන්න. (ල. 3)
(ii) ක්ෂණික නිරූපණයකදී නළුවෙකුට ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න. (ල. 4)
(iii) ඔබට පන්තියේ ක්ෂණික නිරූපණයක් කිරීමට ගුරුවරයා පවරන ලදැයි සිතන්න. එය සිදු කල ආකාරය හා එහිදී ඔබට මතු වූ ගැටළු මොනවාද? විස්තර කරන්න. (ල. 5)

05. (i) 'අංග රචනය' යනු කුමක්ද? (ල. 3)
(ii) අංග රචනයේදී භාවිත කරන ප්‍රධාන ශිල්ප ක්‍රම කීය ද? විස්තර කරන්න. (ල. 4)
(iii) ඔබ පන්ති කාමරයේදී අංග රචනයක් සිදු කළ ආකාරය පිළිවෙළින් විස්තර කරන්න. (ල. 5)

06. (i) නාට්‍යක් යනු කුමක්ද නිර්වචනය කරන්න. (ල. 2)
(ii) නාට්‍ය සජීවී කලාවක් වන්නේ කෙසේද? පැහැදිලි කරන්න. (ල. 4)
(iii) 'නාට්‍යය යනු සාමූහික ප්‍රයත්නයක මහා ප්‍රතිඵලයකි.' මෙම ප්‍රකාශය සම්බන්ධ ඔබගේ අදහස් දක්වන්න. (ල. 6)

07. සිතුම් අම්මාගේ දැඩි විරෝධතාව නොසලකාම පාසල් යාමට නිවසින් එළියට බැස්සේ සිතේ දෙගිඩියාවෙන් වුවද බස් රථයේ දී ඔහුට හමු වූ පාසලේ මිතුරු මිතුරියන් නිසා සිතෙහි පැවති එම නොසන්සුන්කම දුරුවිය. බස් රථයේ අසුන් හිස්ය. යාළුවන්ද කිසිදු කතාවක් නැත. රියදුරාගේ අධික ශබ්ද සින්දු ද නැත. වේගයෙන් ඉදිරියට ගිය බස්රථය 'බරාස්' ශබ්ද නගමින් බ්‍රේක් ගැසුනේ අප සියලු දෙනා විසි කරමිනි. ....
ඉහත සිදුවීම පදනම් කරගෙන ඉන් ඉදිරියට සංවාද, චරිත, යොදා නාට්‍යමය අවස්ථා සහිතව නාට්‍ය පෙළක් රචනා කරන්න.